සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

# II පත්‍රය

## නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන

## ''අදිති''

3

කාලය පැය 1 මිනිත්තු 15

විභාග අංකය :- ....................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වන පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- කටුවැඩ සඳහා කොළයක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පසු ඇගයීම කළ බව සහතික කිරීම | <br>V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇත. ඇගයීම නිවැරදි බව සහතික කරමි. | <br>V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම කර ප්‍රධානය කළ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | <br>V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණු නිවැරදි ය. | <br>V/I/S/CH |

'අදිති' ප්‍රශ්න පත්‍ර පිළිතුරු හා ගැටලු සඳහා TV සත්සල් හා anueducation.lk භාවිතා කරන්න.

(01) පහත දැක්වෙන ඡේදය කියවන්න.

නැගෙනහිර අහසේ හිරු පායා ගෙන එන්නේ තවත් අලුත් දවසක් උදා කරමිනි. අද පාසල් නිවාඩු දිනයකි. මම උදෑසන ම පිබිදී මිදුලට ආවෙමි. වතුසුදු ගස මලින් පිරී ඇත්තේ සුදුමල් වට්ටියක් ලෙසිනි. කඩුපුල් ගසේ ඊයේ රෑ පිපුණු මල පර වී ඇත. වෙන දා ට ආච්චී එය රාත්‍රියේ දී ම පූජා කරයි. වත්ත පහළ ගස්වල කුරුල්ලන්ගේ කීචි බීචි නාදයෙන් මුළු පරිසරය ම ප්‍රබෝධවත් වෙයි.

තාත්තා උදැල්ල ගෙන කුඹුරට යාමට සූදානම් වෙයි. අම්මා ලහිලහියේ ආහාර සූදානම් කරන්නේ අද ඇයත් කුඹුරට යන නිසා ය. මගේ යහළුවන්ගේ තාත්තලා ද කුඹුරු වැඩට යති.

ඡේදය ඇසුරින් පිළිතුරු ලියන්න.

(i) ඉහත ඡේදයෙන් කියවෙන්නේ දවසේ කුමන කාලයක් පිළිබඳව ද?

..............................................................................................................................

(ii) මුළු පරිසරය ම ප්‍රබෝධවත් වන්නේ කුමකින් ද?

..............................................................................................................................

(iii) උපමාවක් ඡේදයෙන් තෝරා ලියන්න.

..............................................................................................................................

(iv) ඡේදයේ සඳහන් මහාප්‍රාණ අක්ෂරයක් සහිත වචනයක් ලියන්න.

..............................................................................................................................

(v) කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුරු තුනක වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.

..............................................................................................................................

(vi) බහු වචන වර්තමාන කාල ක්‍රියා පදයක් ඡේදයෙන් සොයා ලියන්න.

..............................................................................................................................

(02) පහත එක් එක් වගන්තියට ගැළපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) ගංගා උතුරා .................................. (ගැලුවේ ය. / ගැලුවෝ ය)

(ii) ඔවුහු පුස්තකාලයට ................................ (ගියේ ය. / ගියහ)

(iii) ඇ රසවත් කෑමක් ......................................... (සාදයි / සාදති)

(iv) වෛද්‍යවරු රෝගීන් පරීක්ෂා ...................................... (කළෝ ය / කළේ ය)

(03) පහත සඳහන් වාක්‍ය ලිඛිත භාෂාවට හරවා ලියන්න.

(i) ඔහු ගීතයේ තාලයට නැටුවා.- ..............................................................................................

(ii) අක්කලා ගීත ගායනා කළා. -.................................................................................................

(04) පහත එක් එක් ප්‍රශ්නයේ නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) (i) කොට්ටාසය (ii) කොට්ඨාශය (iii) කොට්ඨාසය

(ii) (i) ගිනිමැළ (ii) ගිණිමැළ (iii) ගිණිමැල

(iii) (i) මර්ධනය (ii) මර්දනය (iii) මර්ධණය

(05) බහු වචන අතීතකාල ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) ගියේ ය (ii) යති (iii) ගියෝ ය

(06) සුදුසු විරාම ලකුණු යොදන්න.

මොනවද කට්ටිය හෙමින් කියවන්නේ ගුරුතුමිය අප දෙස බලමින් ඇසුවා ය

(07) (i) සුදුසු ප්‍රස්තාව පිරුළ ලියන්න.

දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම.

..............................................................................................................................

(ii) පහත ආප්තෝපදේශයේ ඉතිරි කොටස සම්පූර්ණ කරන්න.

ඇවිළෙන ගින්නට ..........................................................................................................

(08) පහත වචන නිවැරදි ව ගළපා වගන්තිය නැවත ලියන්න.

ග්‍රහලෝක / දී / පිළිබඳ / වර්තමානයේ /විවිධ / කරයි / පර්යේෂණ / සිදු


..........................................................................................................................................

(09) පහත යුගල පද සම්පූර්ණ කරන්න.

(i) යාන - ......................................... (ii) කෙළි - .........................................


(10) එක් එක් රූපවලට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරින් ම ලියන්න.

(i)



| | | | | | |
|---|---|---|---|---|---|

(ii)



| | | | | |
|---|---|---|---|---|

(11) දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) many/there/are/flowers/How- ..........................................................................

(ii) have/pencil/Do/a/you - ...................................................................................

(12) එක් එක් ඉංග්‍රීසි වචනයේ අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Hoppers -........................................ (ii) Train -.............................................

(13) දෙමළ බසින් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

අයියලා ඉන්නවා. - ..........................................................................................

(14) පහත දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල අර්ථය ලියන්න.

මාම්පළම් වේණ්ඩාම් - ...........................................................................................


(ලකුණු 1x30=30)

(15) සංඛ්‍යාංකය ලියන්න.

අසූ දහස් හතර - ..........................................................................................

(16) පාසලක පිරිමි ළමුන් 2876 ක් ද පිරිමි ළමුන් ගණනට වඩා 769 ක් වැඩියෙන් ගැහැනු ළමුන් ද සිටී නම් පාසලේ සිටින මුළු ළමුන් ගණන සොයන්න. ..........................................


(17) ගණක රාමුවේ දැක්වෙන සංඛ්‍යාවට පසු සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.




.....................................................


(18) මල්ලී ළඟ තිබූ මිදි ගෙඩිවලින් $\frac{1}{4}$ ක් අක්කාට ද ඉතිරිය මල්ලී හා අයියා සමසේ බෙදාගත් පසු අයියාට ලැබුණු මිදි ගෙඩි ගණන 18 ක් නම් මල්ලී ළඟ මුලින් තිබූ මිදි ගෙඩි ගණන කීය ද? ....................................................................................................................

(19) පහත ඝන වස්තු දෙකේ ඇති ශීර්ෂ හා මුහුණත් මුළු එකතුව කීය ද?



..................................................

(20) අම්මා වැඩ අවසන් කර සවස නිවසට පැමිණි වේලාව පහත ඔරලෝසුවේ දැක්වේ. එය සම්මත ක්‍රමයට (පැය විසිහතර ඔරලෝසු වේලාවෙන් ) ලියන්න.



| : |
|---|

(21) රෝම ඉලක්කමෙන් ලියන්න. 18 -............................................

(22) පහත බිල්පත සම්පූර්ණ කරන්න.


| ද්‍රව්‍ය | ප්‍රමාණය | කිලෝග්‍රෑම් එකක මිල | | වටිනාකම | |
|---|---|---|---|---|---|
| | | රුපියල් | සත | රුපියල් | සත |
| සහල් | 2kg 500g | 110 | 00 | ……………….. | …… |
| සීනි | 750g | ……………….. | ….. | 90 | 00 |
| එකතුව | | | | 365 | 00 |

(ලකුණු 2x2=4)

(23) රටාව හඳුනාගෙන හිස්තැනට ගැළපෙන සංඛ්‍යා දෙක ලියන්න.

...................., ........................, 71, 77, 83, 89

(24) පහත මාර්ග සටහන බලා පිළිතුරු ලියන්න.




(දුර කිලෝමීටරවලින්)

($i$) මහවැව සිට මංගලඑළියට දුර සොයන්න. ....................................$km$

($ii$) කොළඹ සිට පුත්තලමට ගොස් නැවත මංගලඑළියට පැමිණීමට යා යුතු දුර කොපමණ ද?

............................................ $km$

(ලකුණු 1x2=2)

(25) ජලය $24l$ $50ml$ තිබූ භාජනයකට තවත් ජලය $19l$ $90ml$ ක් වත්කළ පසු භාජනයේ ඇති මුළු ජල පරිමාව සොයන්න.

................................$l$ ..........................................$ml$


(26) එක් ළමයෙකුට පොත් 4 බැගින් ළමුන් 428 දෙනෙකුට බෙදා දීමට අවශ්‍ය පොත් ගණන කොපමණ ද?

.............................................................................................................................

(27) දොඩම් ගෙඩි 312 ක් සමාන ව පෙට්ටි 3 ක් සඳහා ඇසුරුම් කළේ නම් එක් පෙට්ටියක ඇති දොඩම් ගෙඩි ගණන කීය ද?

.......................................................................................................................................

(28) ළමුන් 30 ක් සිටින පන්තියක එක් එක් සිසුවා වඩාත් කැමති ආහාර වර්ගය පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයෙන් නිරූපණය වේ. (සියලු ම ළමුන් ආහාර සඳහා කැමැත්ත ප්‍රකාශ කළ ද ඉඳිආප්පවලට කැමති ළමුන් ගණන ප්‍රස්තාරයේ ඇඳ නැත. )




(i) පිට්ටුවලට කැමති ළමුන් ගණනට වඩා බත්වලට කැමති ළමුන් සංඛ්‍යාව කොපමණ වැඩිද?

.......................................................................................................................................

(ii) ඉඳිආප්ප කෑමට කැමති ළමුන් සංඛ්‍යාව ප්‍රස්තාරයේ අඳින්න.

(ලකුණු 1x2=2)

(29) විකිණීම සඳහා ගෙනා සහල් 50kg න් 18kg 600g ක ප්‍රමාණයක් විකුණු පසු ඉතිරි සහල්වල බර කොපමණ ද?

...................................kg .................................g

(ලකුණු 32 යි)

❖ **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

(30) සම ඉරිතැලීම වැනි රෝගී තත්ත්වයක් ඇති වන්නේ කුමන පෝෂ්‍ය පදාර්ථය නොලැබුණු විට ද?

(1) විටමින් $A$ (2) විටමින් $B$ (3) විටමින් $C$

(31) පුද්ගලයෙකු දිනකට පානය කළ යුතු ජලය ප්‍රමාණය තීරණය වන්නේ පුද්ගලයාගේ,

(1) බර අනුව (2) වයස අනුව (3) ශරීර ප්‍රමාණය අනුව

(32) අනාරක්ෂිත අවස්ථාවක් වන්නේ,

(1) නාය යන ස්ථානයක් (2) අලි ඇතුන් ගමන් කරන මාර්ගයක්

(3) වීදුරු බඳුන් අතැතිව දිවීම.

(33) වර්තමානයේ වැඩි වශයෙන් පුද්ගලයින් බෝ නොවන රෝගවලට ගොදුරු වීම් වැඩි වශයෙන් දක්නට ලැබේ. මීට බලපාන ප්‍රධාන හේතුව ලෙස සැලකෙන්නේ,

(1) මදුරුවන් වැනි මිනිසාට අහිතකර සතුන්ගේ බෝවීම වැඩිවීම.


(2) මිනිසුන්ගේ වැරදි ජීවන රටා

(3) පරිසරය අපවිත්‍ර වීම.

(34) ජලය පිර වූ වීදුරුවකට අයිස් කැටයක් දැමූ විට සිදු වන දෙයක් නොවන්නේ මින් කුමක් ද?

(1) අයිස් කැටය ජලයේ පාවෙයි. (2) වීදුරුවේ මතුපිට ජල බිඳිති තැම්පත් වෙයි.

(3) අයිස් කැටයේ ප්‍රමාණය වැඩි වෙයි.

(35) 


රූපයේ දැක්වෙන ABC අක්ෂරවලට අදාළ පළාත් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) නැගෙනහිර, වයඹ, බස්නාහිර

(2) නැගෙනහිර, බස්නාහිර, වයඹ

(3) බස්නාහිර, වයඹ, නැගෙනහිර

(36) වීඩියෝ දර්ශන මඟින් තොරතුරු යැවීම, ලිපි යැවීම, පින්තූර යැවීම මඟින් තොරතුරු සන්නිවේදනය කරන වර්තමානයේ බොහෝ දෙනා බහුල ව භාවිත කරන සන්නිවේදන මාධ්‍යයකි.

(1) විද්‍යුත් තැපැල (2) රූපවාහිනිය (3) ගුවන් විදුලිය

(37) 'සියලු දෙයින් ම ජය ලබන්න මට පුළුවන්'' මෙය සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ ඇතුළත් පියවර වන්නේ,

(1) අධිෂ්ඨානය (2) උදානය (3) මානසික ලිහිල් බව

(38) විරිතක් වන්නේ,

(1) කෑමට පෙර අත් සේදීම (2) වැඩිහිටියන් දුටු විට අසුනෙන් නැගිටීම.

(3) ශබ්ද නඟමින් ආහාර ගැනීම.

(39) රටේ ජාතික උරුමයන් රැක ගැනීමෙන් හා ඒවා ආරක්ෂා කිරීමෙන් සිදු වන යහපත් තත්වයක් නොවන්නේ,

(1) තම රටේ අනන්‍යතාව ආරක්ෂා වීම. (2) රටට කීර්ති නාමයක් ගෙන දීම.

(3) සංස්කෘතික වටිනාකම දිනෙන් දින පහළ යාම.

(40) රාජ්‍ය ලාංඡනයේ සිංහ රූපයෙන් හා වී කරල්වලින් පිළිවෙළින් අදහස් වන්නේ,

(1) සිංහල ජනතාව, ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය

(2) රට හා විනයගරුක ජනයා, සෞභාග්‍ය හා පරිපූර්ණ බව

(3) රට හා විනයගරුක ජනයා, ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය

(41) 'ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි' නමින් තුන් සිංහලයේ ම රජු නමින් ඔටුනු පලඳවනු ලැබුවේ,

(1) මොනරවිල කැප්පෙටිපොළ දිසාව (2) ගොංගාලේගොඩ බණ්ඩා

(3) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

(42) පහත රූප අතරින් වඩු කර්මාන්තයේ භාවිත කරන උපකරණයක් නොවන්නේ,

(1)  (2)  (3) 

(43) වාහනයකට අවශ්‍ය ආදායම් බලපත්‍රයක් ලබා ගැනීමට යා යුතු ආයතනය වන්නේ,

(1) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(3) ප්‍රාදේශීය සභාව


(44) සතුන් මගින්, පිපිරීමෙන් හා සුළඟ මගින් ව්‍යාප්ත වන බීජ පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) කජු, කුඩලු, අඟුණ (2) නාගදරණ, පොල්, හොර


(3) තුත්තිරි , වරා, කුඩලු

(45) ළමුන් තිදෙනෙකු කළ ක්‍රියාකාරකම්වල පින්තූර තුනක් පහත දැක්වේ. එහි ආලෝකය වැඩි පින්තූරයට අදාළ පිළිතුර වන්නේ,


(1)




(2)




(3)




(46) ඒක දේශික ශාක පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) කෙකටිය, හොර, ගොඩපර, නුග


(2) හොර, හීං බෝවිටියා, ගොඩපර, බිං කොහොඹ

(3) මා වේවැල්, ගොඩපර, බෝ, කෙකටිය

(47) ප්‍රෝටීන් බහුල ව පවතින ආහාර වර්ගයක් වන්නේ,

(1) බතල (2) බත් (3) මස්

(48) රථවාහන ආලෝක සංඥා පුවරුවක පහත දැක්වෙන *A* අක්ෂරයට අයත් බල්බය දැල්වෙන විට පදික මාරුවේ සිටින මගින් කළ යුත්තේ,




(1) පාර මාරු වීමට සූදානම් වීම.

(2) පාර මාරු වීම.

(3) පාරු මාරු වීමෙන් වැළකීම

(49) ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවකට මායිම් වූ දිස්ත්‍රික්ක පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) කොළඹ, ත්‍රිකුණාමලය, වවුනියා (2) පුත්තලම, අම්පාර, ගම්පහ

(3) ගාල්ල, මාතර, කෑගල්ල

(50) සමාජ විරෝධී ක්‍රියා තුළින් පුද්ගලයාට සිදුවන අයහපතක් වන්නේ,

(1) ආත්ම ගරුත්වයට හානි නොවීම. (2) දඬුවමට ලක්වීම.

(3) අන් අයගේ ප්‍රසංශා ලැබීම.

(51) ශ්‍රී ලංකාවට ආවේණික ක්ෂීරපායි සතෙකු, පක්ෂියෙක් හා උරගයෙක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) හික්මියා, හබන් කුකුළා, මල්පුලුට්ටා (2) කලවැද්දා, යක් කටුස්සා, වලිකුකුළා

(3) කළු වඳුරා, කැහිබෙල්ලා, දියනයා

(52) පහත ආයතන අතරින් රාජ්‍ය ආයතනයක් නොවන්නේ මින් කුමක් ද?

(1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (2) පොලීසිය (3) සුපිරි වෙළෙඳසැල්

(53) අපිරිසිදු ජලය පානය කිරීම මගින් ඇතිවිය හැකි රෝග ඇතුළත් පිළිතුර වන්නේ,

(1) හෙපටයිටීස්, පාචනය, කොලරාව (2) පාචනය, සෙංගමාලය, මී උණ

(3) අතීසාරය, කහ උණ, දියවැඩියාව

(54) රසායනික පොහොර භාවිතයේ ඇති අවාසියක් වන්නේ,


(1) විස රහිත ආහාර ගැනීමට හැකි වීම. (2) විස සහිත ආහාර ගැනීමට සිදුවීම.

(3) පාංශු ජීවීන්ට හිතකර වීම.

(55) ඇස් හා කන් මගින් අපට තොරතුරු ලැබෙන මාධ්‍යයක් නොවන්නේ,

(1) රූපවාහිනිය (2) ගුවන්විදුලිය (3) වේදිකා නාට්‍ය

(56) පහත රූපය සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,




(1) පැඩලය සම්බන්ධ වී ඇති දැති රෝදය එක් වටයක් කරකැවෙන විට B දැති රෝදය වට කිහිපයක් කැරකේ.

(2) B දැති රෝදය එක් වටයක් කරකැවෙන විට A දැති රෝදය වට කිහිපයක් කැරකේ.

(3) B දැති රෝදයට පිටුපස රෝදය සම්බන්ධ වී ඇත.

(57) බීජයක් පැළවීමට අවශ්‍ය සාධකයක් නොවන්නේ,

(1) උෂ්ණත්වය (2) තෙතමනය (3) සරු පස

(58) 

පහත කලාත්මක ස්ථානය පිහිටි පළාත වන්නේ,

(1) මධ්‍යම පළාත

(2) උතුරු මැද පළාත

(3) බස්නාහිර පළාත

(59) සිතියම්වල මහා මාර්ග, දුම්රිය මාර්ග හා අධිවේගී මාර්ග දැක්වෙන සම්මත වර්ණ පිළිවෙළින් ඇති පිළිතුර වන්නේ,

(1) රතු, කළු, දම් (2) කළු, රතු, දම් (3) දම්, රතු, කළු

(ලකුණු 1x30=30)

(60) දිනුකගේ නිවස පිහිටා ඇත්තේ ගං ඉවුර අසල ය. එදින අම්මා සහ මල්ලී සමඟ දිනුක නිවසේ සිටින අතරතුර ඇදහැලුණු ධාරානිපාත වර්ෂාවත් සමඟ ගඟේ ජල මට්ටම ද ඉහළ ගොස් තිබුණේ ය. සුළු මොහොතකින් ප්‍රදේශය පුරා පැතිරුණු ජල කඳ නිවස තුළට ද ගලා එන්නට පටන් ගත්තේ ය. තත්ත්වය තවත් දරුණු විය. දිනුක ඔබ යැයි සිතා මින් ඉදිරියට ඔබ සිදුකරන දේ වාක්‍ය 3 කින් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු අතර උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය. )

(1) ..............................................................................................................

..............................................................................................................

(2) ..............................................................................................................

..............................................................................................................

(3) ..............................................................................................................

..............................................................................................................

(ලකුණු 2x3=6)

පැහැදිලි අත් අකුරු සඳහා ලකුණු 2 ක් ප්‍රදානය කරන්න.